**මන්මුනෙයි බටහිර ප්‍රාදේශීය සභාව**
**මඩකලපුව දිස්ත්‍රික්කය**
**--------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 22 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර ඒ පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දින සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මන්මුනෙයි බටහිර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වියදම් ණය හිමියන් බැරකම් වශයෙන් දක්වන්නේ නම් අදාළ භාණ්ඩ හෝ සේවාවන් පරිභෝජනය කර හෝ සේවාව අවසන් වී තිබිය යුතුය. එසේ වුවත්, සභාවට අයත් එක් බැංකුවක් ක්‍රියාත්මකව පවතින ගොඩනැගිල්ලේ විස්තීරණ කටයුතු ආරම්භ කර නොමැති වුවත්, රු.2,200,350 ක් වියදම් ණයහිමියන් ලෙස තැන්පත් ගිණුමේ දක්වා තිබුණි. | භාණ්ඩ හෝ සේවා පරිභෝජනය කළ පසුව පමණක් වියදම් ණයහිමියන් හි දැක්විය යුතුය. | වර්තමානයේ අදාළ බැංකුව ක්‍රියාත්මකව පවතින අවස්ථාවේදී විස්තීර්ණ කටයුතු ආරම්භ කර තිබුණි. ඉදිරියේදී මෙය නිරවුල් කරනු ලැබේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ සභාව විසින් ගිණුම් වාර්තාවේ සුළු ණයගැතියන් ලෙස වෙන්කරන වටිනාකමට වෙනමම ගිණුම් නොතබා තැන්පත් ගිණුම මාර්ගයෙන් රු.2,528,195 ක් දැක්වීම නිසා තැන්පත් ගිණුම එම වටිනාකමින් වැඩියෙන් දැක්වේ. | සුළු ණයගැතියන් ගිණුමේ දැක්විය යුතු වීම. | සුළු ණයගැතියන් වෙනමම ගිණුම්ගත නොකර තැන්පත් ගිණුමේ දැක්වීමට හේතුව ප්‍රමාණවත් පැහැදිලි කිරීමක් නොවූ බැවිනි. වර්තමානයේ වෙනමම ගිණුම් තැබීම සඳහා කටයුතු සලසා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලපරිච්ඡේදයට පළාත් භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවෙන් දේපල පැවරීම, දැවැදි සහ පරිත්‍යාග මත අයකළ යුතු මුද්දර ගාස්තු රු.3,389,400 ක් ලෙස ගණනය කර තිබුණත් එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර නොතිබුණි. | උපචිත ගිණුම් පදනම මත අයකර ගත යුතු මුද්දර ගාස්තු මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. | මේ දක්වා කාලය තුළ සභාව විසින් සකස් කළ මූල්‍ය ප්‍රකාශනවල මුද්දර ගාස්තු හිඟ හිටි වශයෙන් දක්වා නොමැත. 2019 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල මෙය හිඟහිටි වශයෙන් දක්වනු ලැබේ. |
| (ඈ) | ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී 2017 වර්ෂය වෙනුවෙන් වූ මුද්දර ගාස්තු රු.3,826,239 කින් නැගෙනහිර පළාත් භාණ්ඩාගාරය විසින් පරිපාලන වියදම් සඳහා අයකළ 1% ක් හෙවත් රු.38,262 ක් ද, මඩකලපුව දිස්ත්‍රික් සහකාර ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට ගෙවා තිබූ රු.66,900 ක් ද ගෙවූ බවට ගිණුම්වල දක්වා නොතිබුණි. | ලැබූ ආදායමින් ගෙවා තිබූ වියදම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. | 2017 වර්ෂයට අදාළ මුද්දර ගාස්තු වලින් අයකළ පරිපාලන වියදම්, දිස්ත්‍රික් සහකාර ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට ගෙවා තිබූ මුදල් මේ දක්වා ගිණුම්වල දක්වා නොමැත. හේතුව ඉහත සඳහන් වටිනාකමින් අඩු කළ පසු ඉතිරිය පමණක් අපට ලබා දේ. මෙම වර්ෂයේදී මේවා ගිණුම්ගත කිරීමට කටයුතු යොදා ඇත. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ වීථි විදුලි පහන් මිලදී ගැනීමේ වියදම් රු.1,380,075 ක් සහ වාහන සඳහා ටයර් මිලදී ගැනීම රු.544,200 ක පුනරාවර්තන වියදමකි. (ආදායම්/ වියදම් ගිණුම) එසේ වුවත්, මෙම වටිනාකම් මූලධන වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ආදායම් වියදම් ගිණුමේ ගිණුම්ගත කළ යුතු වීම. | ආදායම් වියදම් ගිණුමේ ප්‍රතිපාදන නොමැති වීම නිසා මූලධන වියදම් ලෙස දක්වා ඇත. ඉදිරියේදී නිරවුල් කරනු ලැබේ. |

**1.3.2 ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වියදම් ණයහිමියන් ගිණුමේ දැක්වෙන රු.1,873,377 ක් මේ දක්වා නිරවුල් නොකර වියදම් ණයහිමියන් ලෙස ඉදිරිපත් කරමින් පැවතුණි. | වියදම් ණයහිමියන් ලෙස දක්වන්නේ නම් එය වර්ෂයක් ඇතුළත නිරවුල් කළ යුතු වීම. | වියදම් ණයහිමියන් රු.1,878,377 ක් නිරවුල් කිරීමට කටයුතු කර ඇත. |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නිතී, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව

| | නිතී,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 41(2) | මෝටර් රථ මිලදී ගැනීමට ප්‍රථම අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත්, එම අනුමැතිය ලබාගැනීමකින් තොරව DAF 8438 දරන වාහනය මිලදී ගෙන තිබුණි. | අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතුය. | ගෞරව පළාත් සභික දූරෙයිරත්නම් මහතා විසින් රු.1,000,000 ක මූල්‍ය ප්‍රතිපාදන සලසා තිබුණි. එවකට ලේකම්වරයාගේ කාල පරිච්ඡේදයේ පළාත් පාලන කොමසාරිස්වරයා, පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාගේ අනුමැතිය සහිතව මෙම වාහනය මිලදී ගැනීම සිදු කෙරුණි. මෙවැනි ක්‍රියාවන් ඉදිරියේදී නිසි පටිපාටීන් අනුගමනය කරමින් සිදු කරනු ලැබේ. |
| (ආ) | මුදල් අමාත්‍යාංශයේ 2016 මාර්තු 17 දිනැති අංක 1/2016 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 5.2 වගන්තිය | කැබ් රථ විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලින් අනුගමනය කරමින් මූල්‍ය ප්‍රතිපාදනවලට අනුව රාජ්‍ය ආයතනවලින් මිලදී ගැනීම සිදුකළ හැකිය. එසේම, පූර්ව අනුමැතිය 2.2 ඡේදයේ සඳහන් ආකාරයට අදාළ භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවෙන් ලබාගත යුතුය. | පූර්ව අනුමැතිය ලබාගත යුතු වීම. | එවකට ලේකම්වරයාගේ සමයේ පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතීන් සහිතව මෙම වාහන මිලදී ගැනීම සිදු වී තිබුණි. මෙවැනි ක්‍රියාකාරකම් ඉදිරියේදී නිසි පරිපාටීන් අනුගමනය කරමින් සිදුකරනු ලැබේ. |
| (ඇ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2018 ජූලි 09 දින පළකරනු ලැබූ 34 වැනි අතිරේකයේ 2.14.1 වගන්තිය | රු.200,000 කට අධික වාහන අලුත්වැඩියා වියදම් සඳහා පූර්ව අනුමැතිය අමාත්‍යාංශ ලේකම්වරයාගෙන් ලබාගත යුතුය. එසේ වුවත්, මෙයට | අමාත්‍යාංශ ලේකම්වරයාගෙන් පූර්ව අනුමැතිය ලබාගෙන තිබිය යුතුය. | රු.200,000 කට වැඩි වාහන අලුත්වැඩියා සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගැනීම වෙනුවට, සභාවේ අනුමැතිය, පළාත් පාලන කොමසාරිස්වරයා, පළාත් පාලන සහකාර කොමසාරිස්වරයා වැනි |

| | | | | |
|---|---|---|---|---|
| | | පටහැනිව සභාව විසින් අංක 53-8521 දරන වාහන අලුත්වැඩියාව සිදුකර තිබුණි. | | නිලධාරීන්ගේ අනුමැතිය සහ යාන්ත්‍රික ඉංජිනේරුවරයාගේ වාර්තාව ලබාගෙන පිකප් වාහන (53-8521) අලුත්වැඩියා කර ඇත. ඉදිරියේදී නිසි අයුරින් පරිපාටීන් අනුගමනය කරනු ලැබේ. |
| (ඈ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛයේ IV වැනි වගන්තිය | නිවාඩු දින වැටුප් ගෙවීමේදී වේලාව පදනම් කරගැනීමේදී එම වේලාව ඇඟිලි සලකුණු යන්ත්‍රය මඟින් තහවුරු කරගත යුතුය. | ඇඟිලි සලකුණු යන්ත්‍රය මඟින් තහවුරු කරගත යුතුය. | නිවාඩු දින වැටුප් ගෙවීමේදී පැමිණීමේ ලේඛනයේ කාර්යාලයට පැමිණීමේ වේලාව, පිටවීමේ වේලාව ආදිය තහවුරු කිරීමෙන් පසුව ගෙවීම් සිදුකර ඇත. නිවාඩු දින දීමනා ලබාදීමේදී ඇඟිලි සලකුණු සටහන් තබා ගෙවීම් කිරිමට ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (ඉ) | නැගෙනහිර පළාත් 2018 ජුනි 04 දිනැති අංක PT/04(2)/2018 දරන පළාත් මූල්‍ය චක්‍රලේඛයේ 7.1 ඡේදය | රු.500,000 කට වැඩි භාණ්ඩ මිලදී ගැනීමේදී තීරණය කිරීම ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව විසින් සිදු නොකර එයට පටහැනිව ප්‍රසම්පාදන කමිටුවේ සහ තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශයන් රහිතව අංක DAF 8438 දරන වාහනය මිලදී ගැනීම සැපයුම්කරු තෝරා පත් කර තිබුණි. | ප්‍රසම්පාදන කමිටුවේ සහ තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශයන් සමඟ මිලදී ගැනීම් සිදුකළ යුතුය. | පළාත් පාලන කොමසාරිස්වරයා, සහකාර පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතිය සහිතවත් ලියාපදිංචි කළ පුද්ගලික ආයතනයක් බැවින් සෘජුවම හිටපු ලේකම්වරයා විසින් අංක DAF 8438 දරන වාහනය මිලදී ගැනීමට සැපයුම්කරු තෝරාගැනීම සිදු වී තිබුණි. ඉදිරියේදී මූල්‍ය චක්‍රලේඛ අනුගමනය කරමින් නිවැරදි ආකාරයෙන් ක්‍රියාමාර්ගයන් ගනු ලැබේ. |

### 1.4.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

---------------------------------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ------------- | -------------------------------- |
| පසුගිය සහ සමාලෝචිත වර්ෂයේ නිම කළ ගිවිසුම් කාර්යයන් 05 ක් සඳහා කොන්ත්‍රාත්කරුවන්ට රු.740,586 ක් අගය එකතු කළ බදු ලෙස ගෙවීම් කර තිබුණි. නමුත් එම සැපයුම්කරුවන්ගෙන් “වැට් | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව නිකුත් කළ 2002 වර්ෂයේ අංක 14 දරන අගය එකතු කළ බදු පනතේ 20 වගන්තිය සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ | පසුගිය සහ සමාලෝචිත වර්ෂයේ සිදුකළ කොන්ත්‍රාත් කාර්යයන් සඳහා කොන්ත්‍රාත්කරුවන්ට ලබා දී තිබූ අගය එකතු කළ බදු රු.740,586 ක් VAT |

| | | |
|---|---|---|
| ඉන්වොයිසිය” (VAT Invoice) ලැබී නොතිබුණි. එසේම, ගෙවා තිබූ අගය එකතු කළ බදු සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවටත්, විගණකාධිපතිවරයාටත් දැනුම් දී නොතිබුණි. | 5.4.11මාර්ගෝපදේශයේ දක්වා තිබූ ආකාරයට බදු ගෙවීම් සිදු කර තිබිය යුතුය. | ඉන්වොයිසිය නොමැතිව ගෙවීමට හේතුව ප්‍රමාණවත් දැනුවත් වීමක් නොතිබීමයි. ඉදිරියේදී මෙය නිවැරදිව සිදුකිරීමට කටයුතු කරනු ලැබේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.4,190,480 ක් වූ අතර ඉකුත් වර්ෂය සමග සැසඳීමේ දී ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,728,470 ක්වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,537,990 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සභාව විසින් දේපල බදු දීමේදී ඇප නොලබා ගිවිසුම් අත්සන් කර තිබුණි. මේ නිසා දේපල බදු පදනමින් ලබාගත් අය, බදු කුලී ගෙවීම් පැහැර හැරීමේදී සභාවට ආදායම් අහිමි විය හැකිය. | ඇප ලේඛන හෝ ඇප මුදල් ලබාගත යුතු වීම. | සභාව විසින් පොදු වෙළඳපොල, කඩ කාමර බදු දීමේදී බදු මුදලින් අඩක් අත්තිකාරම් ලෙස ලබා ගැනීමෙන් අනතුරුව පමණක් ගිවිසුම් අත්සන් කරනු ලැබේ. තවද, අඩක් වාරික 06 කට බෙදා ජනවාරි සිට ජුනි මාසය ඇතුළත ගෙවිය යුතුය. අදාළ මාසික වාරිකයන් නොගෙවූ වාරික මුදල් සඳහා 10% ක දඩ ගාස්තු ද අයකරනු ලැබේ. එසේම, රු.250,000 ට වැඩි බදු මුදල් සඳහා තැන්පතු මුදල් ලෙස රු.25,000 ක් ලබාගෙන ඇත. තවද, බදු වාරික මාස 05 ක් අඛණ්ඩව නොගෙවීමේදී සභාව විසින් වගකීම් භාරගෙන වෙනත් පුද්ගලයෙකුට ලබාදීමට කටයුතු කරනු ලැබේ. විශාල වටිනාකම් සඳහා බදු ලබා නොදෙන බැවින් දේපල ඇප ලබා නොගනී. |

| | | | |
|---|---|---|---|
| (ii) | අදාළ ඇතැම් ඉඩම් විකුණුම් මත සියයට 1 ක විකුණුම් බදු අයකළ යුතු වුවද, 2017 වර්ෂයේදී විකුණනු ලැබූ ඉඩම්වල මුළු වටිනාකම එකතුව රු.12,228,000 කින් බදු වශයෙන් රු.122,280 ක් අයකිරීම සඳහා සභාව විසින් කටයුතු කර නොතිබුණි. | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ පවතින ඕනෑම ඉඩමක් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ වෙනත් ආකාරයෙන් හෝ වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුට සේවය කරන්නෙකු හෝ ඔහුගේ නියෝජිතයෙකු මඟින් විකිණීමේදී, විකුණුම්කරුවකු හෝ එවැනි වෙන්දේසි විකුණුම්කරුවකු හෝ තැරැව්කරුවකු හෝ ඔහුට සේවය කරන්නෙකු හෝ ඔහුගේ නියෝජිතයා එවැනි ඉඩම් විකිණීමේදී විකුණුම් වලින් ලැබෙන මුදලින් සියයට 1 කට සමාන වූ බද්දක් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතුය. එලෙස සඳහන් වීම නිසා සභාපතිවරයාගේ පිළිතුර භාරගත නොහැක. එම නිසා, මෙම විධිවිධානවලට අනුව ඉඩම් විකුණුම් බද්ද අයකර ගත යුතුය. | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය ප්‍රකාරව, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමකදී පමණක් ලැබෙන මුදලින් 1% ක් අයකළ හැකි බව සඳහන් වේ. |

## 3.2 වත්කම් කළමනාකරණය

---------------------------------

### 3.2.1 නඩත්තු කිරීම හා අලුත්වැඩියා සිදුකිරීම

--------------------------------------------

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ------------- | ------------------------------------ |
| (අ) | ප්‍රාදේශීය සභාවේ ගබඩා කාමරයේ විවිධ වත්කම් සහ තොග අයිතමයන් භාවිතයට සුදුසු සහ නුසුදුසු අයිතමයන් ලෙස විවිධ භාණ්ඩ දක්නට ලැබුණි. එසේ වුවත්, ඒවා සලකුණු කර ඒවා අලුත්වැඩියා කිරීමට හෝ වෙන්දේසි මඟින් විකිණීමට හෝ කටයුතු කර නොතිබුණි. | | ශාඛාවේ දක්නට ඇති භාවිතයට නුසුදුසු අයිමතයන් සලකුණු කර නියමිත පරිපාටි අනුගමනය කරමින් කටයුතු සිදු කෙරේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාවට අයත් අත් ට්‍රැක්ටර් 01 ක්, Land Vehicle 03 ක්, Motor Lorry එකක්, Tractor Trailer එකක් අලුත්වැඩියා කර භාවිතා කළ හැකි වුවත් වර්ෂ 04 ක් හෝ 05 කට අධික කාලයක සිට අලුත්වැඩියා නොකර පැවතුණි. | භාවිතයට සුදුසු උපකරණ අලුත්වැඩියා කිරීමටත්, භාවිතා කළ නොහැකි උපකරණ සමීක්ෂණය කර වෙන්දේසි කිරීමටත් කටයුතු කර තිබීම. | සභාවට අයත් වාහන විශාල සංඛ්‍යාවක් පළඳු වී ඇත. දැනට ඒවා සුළු වශයෙන් අලුත්වැඩියා කරමින් පවතී. අත් ට්‍රැක්ටර්, Land Vehicle, Motor Lorry, Tractor Trailer සඳහා යාන්ත්‍රික ඉංජිනේරුවරයාගේ වාර්තාව ලබාගෙන කටයුතු කරනු ලැබේ. අත් ට්‍රැක්ටර්, Tractor Trailer ආදිය නියමිත පරිපාටීන් අනුගමනය කර 2019 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයෙන් පොත්වලින් කපා හැරීමට හෝ විකිණීමට කටයුතු කරනු ලැබේ. |

**3.3 ප්‍රසම්පාදනය**

----------------

**3.3.1 ප්‍රසම්පාදන සැලැස්ම**

-----------------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ------------- | ------------------------------------ |
| සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම සභාව විසින් සැපයුම් හා සේවා ක්‍රියාවලිය සඳහා සකසා තිබිය යුතුය. එසේ වුවත්, සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | විධිමත් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ඒ අනුව කටයුතු කළ යුතුය. | සමාලෝචිත වර්ෂය සඳහා වෙනමම ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. ඉදිරියේදී ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කරනු ලැබේ. |

**4. පද්ධති හා පාලන**

-----------------------

පහත සඳහන් ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පාලන ක්ෂේත්‍රය | | විශේෂ අවධානය යොමු කළ යුතු විෂයයන් | | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| ------------------ | | | -------------------------- | ------------------------------------ |
| (අ) | ආදායම් කළමනාකරණය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම. | | පිළිගෙන ඇත. |
| (ආ) | අයවැය පාලනය | අයවැය පිළියෙල කිරීමේදී පසුගිය වර්ෂවල තථ්‍ය වියදම් කෙරෙහි අවධානය යොමු කළ යුතුය. | | |
| (ඇ) | ස්ථාවර වත්කම් පාලනය | (i) | ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගැනීම. | |
| | | (ii) | සභාවේ භාවිතා නොකර නිෂ්කාර්යව පවතින ස්ථාවර වත්කම් භාවිතා කිරීමටපියවර ගැනීම. | |